ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ශ්‍රී ලංකාවේ රෙදිපිළි කර්මාන්තයේ නිර්මාණ ශිල්පීන් 30 දෙනෙකු සඳහා ඉන්දියාවේදී ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක්</u>**

ශ්‍රී ලංකාවේ අත්යන්ත්‍ර සහ යාන්ත්‍රිකරණය කරන ලද රෙදි විවීමේ කර්මාන්තයේ නිර්මාණ ශිල්පීන් 30 දෙනෙකේ විශේෂ රෙදිපිළි පුහුණු සහ ධාරිතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වීම සඳහා 2025 නොවැම්බර් 09-15 වන දින දක්වා ඉන්දීය සංචාරයක නිරත වූහ. ශ්‍රී ලාංකේය වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බවට 2025 අප්‍රේල් මාසයේ ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් සිදු කළ ප්‍රකාශය අනුව මමෙ වැඩසටහන සංවිධානය කරන ලදී.

2. සතියක් පුරා පැවති මමෙ පුහුණු වැඩසටහන ඉන්දීය රජය විසින් තමිල්නාඩුවේ කොයිම්බතූර්හි රෙදිපිළි සහ කළමනාකරණය පිළිබඳ සර්දාර් වල්ලාභායි පටලේ ජාත්‍යන්තර පාසලේදී පවත්වන ලදී. රෙදි වීවීම, නවීන නිර්මාණකරණ තාක්ෂණයන්, අලවේකරණය සහ නායකත්වය පිළිබඳ මොඩියුලයන් ඇතුළු සමස්ත රෙදිපිළි අගය දාමය ආවරණය කරමින් පුළුල් තාක්ෂණික සහ අදාළ තේමාවන්ට අනුකූල සැසි රැසක් මමෙ වැඩසටහන යටතේ පැවැත්විණ. ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම, කර්මාන්තය සම්බන්ධයනේ වැඩිදුර අන්දැකීම් ලබා දීම සහ නිර්මාණකරණය සහ නිෂ්පාදනය සම්බන්ධයනේ හැකියාවන් ඉහළ නැංවීම යනාදිය අරමුණු කර ගනෙ මමෙ සැසි පවත්වන ලදී.

3. අත්දැකීම් ඇසුරින් ඉගනෙ ගැනීම සඳහා සහභාගිවන්නන්ට අවස්ථාව හිමි වූ අතර ඒ අනුව ප්‍රධාන පළෙලේ ආයතන සහ කර්මාන්තශාලා වතෙ ක්ෂේත්‍ර චාරිකා ද සංවිධානය කර තිබිණ. මමෙ නියැළීම් තුළින් නූතන රෙදිපිළි පරිසර පද්ධතීන්, නිෂ්පාදන තාක්ෂණයන්, නිර්මාණ සංවර්ධනය සහ නවීන සිල්ලර වළෙඳෙ පරිසරයන් යනාදිය සම්බන්ධයනේ වටිනා දැනුම් සම්භාරයක් ලබා දනෙ ලදී.

4. වෘත්තීය කුසලතා සංවර්ධනයට අමතරව මමෙ වැඩසටහන තුළින් දූත පිරිසට ඉන්දියාවේ රෙදිපිළි ක්ෂේත්‍රයේ නවෝත්පාදනයන්, කර්මාන්තයේ මනා පිළිවතේ සහ ක්ෂේත්‍රය තුළ සහයෝගීතාවයට පවතින අවස්ථාවන් සම්බන්ධයනේ ද මනා අවබෝධයක් ලබා දනෙ ලදී.

5. ශ්‍රී ලංකාවේ රෙදිපිළි නිර්මාණ ශිල්පීන් සඳහා පවත්වන ලද මමෙ විශේෂ පුහුණු වැඩසටහන වෘත්තීය නිපුණතාවයන් ශක්තිමත් කිරීමට, දැනුම බෙදා හදා ගැනීම් දිරි ගැන්වීමට සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර රෙදිපිළි ක්ෂේත්‍රයේ ආයතනික සබඳතා ගැඹුරු කිරීමට අර්ථවත් දායකත්වයක් ලබා දුන්නේය.

*****

**කොළඹ**

***2025*** පෙබරවාරි ***17***